Department of Education,Sabaragamuwa Province/ Weekly School



නිපුණතා මට්ටම 9.3 - ගැටළු විසඳීම සඳහා ඇල්ගොරිතමික ප්‍රවේශය යොදා ගැනීම.

පරිගණකයක් භාවිතයෙන් ගැටළුවක් විසඳීමට ක්‍රමලේඛයක් සකස් කළ යුතු වේ.මෙය සකස් කිරීමට පෙර ගැටළුව විසඳන ආකාරය පියවරෙන් පියවර ලියා ගැනීමෙන් විසඳුම තේරුම් ගැනීම පහසු වේ.මෙසේ පියවරෙන් පියවර ලියා ගත් විසඳුම ඇල්ගොරිතමයක් ලෙස හඳුන්වනු ලැබේ.

මෙසේ ලියා ගත් ඇල්ගොරිතමයන් ඉදිරිපත් කිරීම සඳහා මෙවලම් භාවිත කෙරේ.ඒවා නම්,

1.ගැලීම් සටහන්
2.ව්‍යාජ කේත

<u>**ගැලීම් සටහන්**</u> - ඇල්ගොරිතමයක් රූපමය ආකාරයෙන් ව්‍යුහගත නොවන ලෙස ඉදිරිපත් කිරීම සඳහා ගැලීම් සටහන් භාවිත කෙරේ.

පරිගණක වැඩසටහන් නිර්මාණයේදී ඒවා අවශ්‍ය ආකාරයෙන් පාලනය කිරීම සඳහා පාලන ව්‍යුහ යොදා ගනී.පාලන ව්‍යුහ ප්‍රධාන වර්ග තුනකි.

1.අනුක්‍රම ව්‍යුහ
2.තීරණ ව්‍යුහ
3.පුනරාවර්තන ව්‍යුහ

<u>**අභ්‍යාස**</u>

1.පහත සඳහන් අවස්ථා සඳහා භාවිත කරන රූපමය සංකේත ඇඳ දක්වන්න.

1.ආරම්භය/අවසානය
2.සැකසුම
3.ආදාන/ප්‍රතිදාන
4.තීරණ ගැනීම
5.අනු සැකසුම
6.ගැලීම් රේඛා
7.සම්බන්ධක

2.පාලන ව්‍යුහ ප්‍රධාන වර්ග තුන උදාහරණ සමඟ පැහැදිලි කරන්න.